උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 17

## පුරා මාස 17 ක් උපේක්ෂා සේනානායක ලියූ අතුල උපසිරි කල්දෙමුල්ල සිතුවම් කළ "ප්‍රතිබිම්බ" අදින් අවසන් වෙයි

ඉඳුවරගේ මාතලේ මහ ගෙදර විශාල ගෙවත්තේ කොනකට වන්නට වූයේ අලිගැටපේර ගසින් සෙවණ වුණු තරමක් සිසිල් පරිසරයකි. කලකට පෙර එහි සවි කළ කුඩා ගල් බංකුව මා වඩාත් ප්‍රිය කළ ස්ථානයයි. මම අතේ වූ මැස්ම උකුළ මත තබා ගෙන ඈත පෙනෙන කඳු වැටිය දෙස බලා සිටියෙමි.

මගේ වම්පසින් ඉතිරිවී තිබූ කුඩා ඉඩේ ඉඳුවර අවුත් හිඳ ගත්තේය. තද තැඹිලි සහ කහ පැහැති ඉරි වැටුණු කපු සරමක් සහ ඇත් දළ පැහැති කමිසයකින් සැරසී සිටි ඔහු වෙතින් මුදු විලවුන් සුවඳක් හමා ආවේය. ඔහු මගේ අත ගෙන සිය උකුල මත තබා ගත්තේය. මම ඉඳුවරගේ උරතලය මත හිස ඔබා ගතිමි.

"මහල ඉවරද" ඔහු පහත් හඬින් ඇසුවේ මගේ හිස අතගාමිනි.

"තාම නැහැ. තව තාරා පැටව් දෙන්නෙක් ඉතුරුයි මහන්න"
ඔහු මගේ මැස්ම ගෙන සුපරීක්ෂාවෙන් ඒ දෙස බලා සිටියේය.

"ඕක දූ පැටියව නෑව්වට පස්සෙ එයාව ඔතාගෙන කාමරේට ගේන්න. මම එයාට සමර් එකට අන්දන්න වෙනම ඇඳුම් මැහුවා. වින්ටර් එකට ඔනෙ ඒවා ඔක්කොම ගෙතුවා"
මම කියවාගෙන ගියෙමි. ඉඳුවර මගේ දෑස දෙස බලා සිටියේය.

"ඔයාට දුකයිද අපිටම කියලා දරුවෙක් නැතුවට" ඔහු තියුණු හඬින් ඇසුවේය.
"මං නැහැ කිව්වොත් ඒක බොරුවක් වෙනවා. ඕනෙම ගෑණියෙක් කැමතියි තමන්ගෙ දරුවෙක් කුසෙන් බිහි කරන්න. නමුත් අපිට ජීවිතේ හැම-දේම ලැබෙන්නෙ නැහැ ඉඳුවර. මට මනහාරී මගේ දරුවෙන් වගේ. එයාට ලැබෙන්න ඉන්න මේ කෙළිපොඩ්ඩ මට දැනෙන්නෙ මගේ මිනිබිරී වගේ. ඒකයි මේ තරම් මහන්සි වෙලා ඇඳුම් ආයිත්තම් හදන්නෙ" මම බිඳෙන්නට ආසන්න හඬින් කිව්වෙමි.

> දුලිනි. අපිට තාම හැමදේම මුල ඉඳන් පටන් ගන්න පුළුවන්



ඉඳුවර ඈත කඳුවලල්ල පහලින් මතුවී ක්‍රමයෙන් විශාල වන රථ පෙළ දෙස බලා සිටියේ මගේ දකුණු බාහුව තදින් අල්ලාගෙනය. මුළුතැන්ගෙය වෙතින් ප්‍රණීත සුවඳක් නැග ඒ. අම්මාත් තනුරක්කාත් මනහාරී වෙනුවෙන් විවධ රස කෑම පිළියෙළ කරති.බිලිං අච්චාරු බෝතලයක් පිළියෙල කිරීමට අවශ්‍ය බිලිං තොගය සොයා ගත්තේ ගමේ මිනිසකු දෙතුන්පලකට යවා ගස් කිහිපයකිනි. මාළු ඇඹුල්තියල් සහ බටු මෝජු මාතලේ එතරම් ප්‍රකට නැති නිසා ඒවා සෑදීම මට බාර විය. උඳු වලලු සහ වෙනත් රසකැවිලිත් ස්වල්පය බැගින් හදා ඇසුරුවේ මනික් වෙනුවෙනි. මනහා-රී ගේ දරු ප්‍රසූතිය වෙනුවෙන් මමත් අපේ අක්කාත් නොබෝ දිනකින් මෙල්බ-ර්න් යෑමට නියමිත බැවින් ඔවුහු මුළුතැන්ගෙයි කාර්යය බහුල වී සිටිති. අප එක පවුලක් ලෙසින් එකතු වී ගමනක් යන බව මට දැනේ. කාත් කවුරුවත් නැති ලෙසට හුදකලාවී දුරු රටක ගෙවූ යුගය මට සිහිවේ. එකල මට තිබුණේ එදිනෙදා වෙනුවෙන් ගොඩනගාගත් කෙටි කාලීන අරමුණු කිහිපයක් පමණි. එහෙත් විශාල පවුලක් හිමි වූ මට අනාගතය වෙනුවෙන් පොදි බඳින්නට සහසක් පැතුම් ඇත. දහසක් වගකීම් ඇත. හිත උණුසුම් හැඟිම් ගොන්නකින් පිරී යනු මට පෙනේ. ඉඳුවර කථා කරනු මට ඇසේ.

"මට ඒ කාලෙ , කැම්පස් යන කාලෙ ඔයාව හරි පුරුදුයි වගේ දැනුණා. මං ඔයාව දන්නවා වගේ දැනුණා. ඔයාගෙ පින්තූරයක් දැකලා අපේ අම්ම කිව්වා ඔයා අපේ පුංචි වගේ කියලා පෙනුමෙන්. මට දැන් තේරෙනවා ඔයා ගතිගුණ අතින් අපේ අම්මමයි කියලා. එහෙම බලද්දි ඔයා අපේ අම්මගෙ ප්‍රතිබිම්බයක්. ඒකයි අම්මයි ඔයයි මේ තරම් සමීප එකි-නෙකාට. ජීවිතේ හරි පුදුමයි දුලිනි. හරියට චිත්‍රපටියක් වගේ. ඔයා සසංකව බැඳපු දවසේ මං පිස්සෙක් වගේ බිව්වා. ඒත් ඊට කලින් අපේ ගෙදරට ඔයා ගැන කිව්වනං ලේසියෙන්ම කැමැත්ත අරං ඔයාව බඳින්න තිබුණා මට. මොන හේතුවක් නිසා හරි ඒක එහෙම වුණේ නැහැ. හැමදේම වෙන්නෙ ඒව වෙන්න තිබුණ විදියට. අන්තිමට හරි අපි එකතුවුණානෙ. අපි ජීවිතේ හොඳම කාලෙ ගෙවලා ඉවරයි කියලා කාටවත් කියන්න බැහැ. අපි තාම තරුණයි දුලිනි. අපිට තාම හැමදේම මුල ඉඳන් පටන් ගන්න පුළුවන්. " ඉඳුවර මගේ දෑස දෙස බලාගෙන කීවේය. ඔහුගේ දෑස දිලිසේ. ප්‍රාර්ථනා පිරුණු ඒ දෑස තුල යෞවනයකු මට පෙනේ. ඈත අතීතයේ මා දුටු ඒ කඩවසම් සුහදශීලී තරුණයා මා ඉදිරියේ සිටී. වෙන-සකට ඇත්තේ අතදැකීම් අතින් අප මුහුකුරා තිබීම පමණය. එය යහපත් ඇරඹුමකට හොඳම කාලයයි.

ඉඳුවර මගේ බඳ වටා අත යවා මා ඔහු වෙත සමීප කරගත්තේය. ඈත කඳුවැටියේ සෙවණැල්ල මාතලේ නගරය මතට වැටී සෙවණ දුන්නේය. සිහින් මුදු සුළඟක් අපේ මුහුණු සිපගෙන හමාගියේය. ඒ සුළඟ මේ අහස යට ඉපදී පැතුම් පොදි බඳින දහසකුත් එකක් පෙම්වතුන්ට සිහිල දෙමින් හමා යන සුළඟකැයි මට සිතේ. මම නිල්වන් අහස්කුෂ දෙස බලමි. අපේ අම්මාගේ මුදු මුහුණ මට පෙනේ. එහි සෙනෙහස උතුරා යනු මට පෙනේ. තාත්තාගේ කරුණාව පිරුණු විශාල දෑස මට පෙනේ. ඒ දෑස ප්‍රීතියෙන් සිනාසෙනු මට පෙනේ. ඉඳුවරගේ ශක්තිමත් දකුණු අත මා තදින් ඔහුට තුරුළු කරගෙන සිටි අතර ඔහුගේ නිදහස් වමත මගේ දෑත තරයේ අල්ලාගෙන සිටියේය. අපි සැහැල්ලුවෙන් අනාගතය වෙත පියනගා යන්නට අදිටන් කරගතිමු.

**අවසානයි**



උපේක්ෂා සේනානායක ලියයි



අතුල උපසිරි කල්දෙමුල්ල ගේ සිතුවමින්